ශීර්ෂය 118- කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය.

ශීර්ෂය 118 - කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 08 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම්

මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 55,007.73 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 53,730.88 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1,276.85 ක් හෙවත් සියයට 2.32 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 53,819.67 | 53,017.92 | 801.75 | 1.49 |
| මූලධන | 1,188.06 | 712.96 | 475.10 | 39.99 |
| **එකතුව** | **55,007.73** | **53,730.88** | **1,276.85** | **2.32** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 11801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 35.50 | 27.53 | 20.58 | 24.68 | 117.00 | 45.36 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0325/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 35.98 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 6.29 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0109/000 | 0.10 |
| 6000/0000/00/0013/0030/000 | 3.22 |
| 6000/0000/00/0016/0056/000 | 1.30 |
| 6000/0000/00/0018/0068/000 | 1.67 |
| **එකතුව** | **6.29** |

## 2.5 විගණන නිරීක්ෂණය

කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

3. **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---

**3.1 විසර්ජන ගිණුම**

---

**අයවැය විචලනය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයන් 07 ක් සඳහා සලසා තිබුණු රු.1,070,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයන් 62 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

විෂය අංක 11801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ස්ථාන මාරු වී ගිය, මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගේ ශේෂවල එකතුව රු.1,445,939 ක් වූ අතර, එම හිඟ හිටි ණය ශේෂ වර්ෂ 1 ක සිට 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණද, එම හිඟහිටි ණයශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

3.3.1 ක්‍රියාකාරී සැලැස්ම

---

සමාලෝචිත වර්ෂය සඳහා විශේෂිත කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්ව නොතිබුණු රු.5,393,870 ක් පිරිවැය වූ ක්‍රියාකාරකම් 08 ක් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව සංශෝධිත ක්‍රියාකාරී සැලැසුමට ඇතුළත් කර 2015 නොවැම්බර් 17 දින අනුමැතිය ලබාගෙන තිබුණි.

3.3.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය ආරම්භවීමට ප්‍රථම වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, 2015 ජූනි මාසයේ දී එම සැලැස්ම පිළියෙල කර තිබූ බැවින්, සැලැස්ම තුළින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

3.3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 අගෝස්තු 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

---

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

පහත සඳහන් කර ඇති පරිදි අමාත්‍යාංශය සතු වාහන 66 ක් බාහිර ආයතන 17 ක් වෙත ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් ලබාදී ඇති ආයතනයේ ස්වභාවය | ආයතන සංඛ්‍යාව | ලබා දී ඇති වාහන සංඛ්‍යාව |
|---|---|---|
| අමාත්‍යාංශ | 01 | 05 |
| දෙපාර්තමේන්තු | 03 | 07 |
| මණ්ඩල | 03 | 14 |
| අධිකාරි | 03 | 18 |
| පළාත් සභා | 01 | 01 |
| සමාගම් | 02 | 15 |
| පලාත් කෘෂිකර්ම | 02 | 02 |
| සංවර්ධන මධ්‍යස්ථාන | 02 | 04 |
| **එකතුව** | **17** | **48** |

(ආ) වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම

අමාත්‍යාංශය විසින් වෙනත් ආයතන 16 ක් සතු වාහන 25 ක් විධිමත්ව පවරා නොගෙන භාවිතයට ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වත්කම් ලබාදී ඇති ආයතනයේ ස්වභාවය | ආයතන සංඛ්‍යාව | ලබා ගෙන තිබුණු වාහන සංඛ්‍යාව |
|---|---|---|
| අමාත්‍යාංශ | 09 | 16 |
| කෘෂිකර්ම සංවිධාන | 02 | 03 |
| ව්‍යාපෘති | 02 | 03 |
| ගොවිජන සේවා | 01 | 01 |
| ඉදිකිරීම් ආයතන | 01 | 01 |
| දිස්ත්‍රික් ලේකම් | 01 | 01 |
| **එකතුව** | **16** | **20** |

(ඇ) වාහන පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). 2015 පෙබරවාරි 21 දින අමාත්‍යාංශයේ වාහනයක් අනතුරකට ලක්වී තිබු අතර එම හානියේ වටිනාකම රු.1,782,680 ක් වී තිබුණි. එහි මූලික පරීක්ෂණයේදී රියදුරුට අවවාද කිරීම පමණක් නිර්දේශ කර තිබු අතර තවදුරටත් වෙනත් වාහනයක රියදුරු ලෙස සේවයේ යොදවා තිබුණි.

(ii). 2014 දෙසැම්බර් 24 දින අමාත්‍යාංශයට අයත් වාහනයක් අනතුරකට ලක්වී තිබූ අතර අදාළ නියෝජිත ආයතනය තක්සේරු කරන ලද අලාභහානියේ අගය රු.4,322,087 ක් විය. රියදුරු බීමත්ව රිය ධාවනයේ යොදවා තිබිම නිසා රක්ෂණ ආයතනය විසින් හිමිකම් ගෙවීම් කළ නොහැකි බව දන්වා තිබුණි. අමාත්‍යාංශය විසින් අදාළ වගකිව යුත්තන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5 අනුකූල නොවීම

-------------------

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(1)(අ) | අමාත්‍යාංශයේ වාහනයක් 2015 පෙබරවාරි 21 දින අනතුරට ලක්වීමෙන් පසු මූලික පරීක්ෂණ වාර්තාව 2015 අගෝස්තු 10 දින ඉදිරිපත් කර තිබුණි. එම වාහනය 2016 අප්‍රේල් මාසයේදී නැවත අනතුරකට පත්වීමෙන් වාහනය පාවිච්චි කළ නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. 2016 ජුනි 08 දින වන විටත් එම අනතුර පිළිබඳව මූලික පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104(1)(ආ) | අලාභහානියේ වටිනාකම රු.500,000 කට වැඩි වන විට දීප ව්‍යාප්ත සේවාවක මාණ්ඩලික නිලධාරියකුගේ සභාපතිත්වයෙන් යුත් මණ්ඩලයක් පත්කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ වාහනයක් අනතුරට පත්වීමෙන් පසු රු.1,782,680 ක අලාභහානියක් සිදු වි තිබුණත්, එම අලාභය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට වැඩබලන පරිපාලන නිලධාරිනියකු පත්කර තිබුණි. එම වාහනය නැවත වරක් අනතුරකට ලක්වීමෙන් පසු එහි මූලික පරීක්ෂණ පැවැත්වීමට සහකාර අධ්‍යක්ෂවරයෙකු පත්කර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 757(2)(අ) | 2014 වර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් අනාවරණය කරගන්නා ලද ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් අදාළ ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය

-----------------------------------------

| | | |
|---|---|---|
| (i) | XV වන පර්විඡේදයේ 5.1 වගන්තිය | 2015 ජුනි 13 දින සිට ජුලි 27 දින දක්වා චීනයේ පැවති Fruit Cultivation Techniques for Developing Countries දින 45 ක පුහුණු පාඨමාලාව සඳහා සහභාගී වූ නිලධාරීන් දෙදෙනකු හා 2015 ජුලි 10 දින සිට 2015 සැප්තැම්බර් 25 දින දක්වා ඊජිප්තුවේ පැවති මාස 2½ ක ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ පුහුණු පාඨමාලාව සඳහා සහභාගි වූ නිලධාරින් දෙදෙනෙකු පුහුණුවෙන් පසු රජය වෙනුවෙන් සේවය කරන බවට නිශ්චිත කාල වකවානු සඳහන් කර ගිවිසුමකට එළඹ නොතිබුණි. |
| (ii) | XV වන පර්විඡේදයේ 10.7 වගන්තිය | විදේශ ගමන් සඳහා දිවයිනෙන් බැහැරවීම සඳහා ජනාධිපතිතුමාගේ/ අගමැතිතුමාගේ අනුමැතිය ලද වහාම නිලධාරියා අයත්වන සේවයට අදාළ පරිපාලන බලධරයා වෙත ඒ බව වාර්තා කළ යුතු වුවත්, 2015 වර්ෂයේදී විදේශ ගත වූ නිලධාරින් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |

(ඇ) ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ

-----------------------------------------

| | | |
|---|---|---|
| (i) | 2015 ජුනි 29 දිනැති අංක එස්බී/2/1 දරන චක්‍රලේඛය | හිටපු අමාත්‍යවරු හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ට අනුයුක්ත කළ වාහන ආපසු භාර ගත යුතු වුවද, නියෝජ්‍ය අමාත්‍යවරයෙක් වෙත අනුයුක්ත කර තිබු වාහනයක් ආපසු අමාත්‍යාංශය වෙත භාර දී නොතිබුණි. |
| (ii) | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන චක්‍රලේඛයේ 3 ඡේදය | අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා වෙන්කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වී තිබුණත්, ඊට අමතරව අමාත්‍යවරයා වෙනුවෙන් වාහන 2 ක්ද, රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් වාහන 2 ක්ද වෙන්කර තිබුණි. |

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

-----------------------------

| | |
|---|---|
| 2014 ජුනි 14 දිනැති අංක 16/2014 දරන චක්‍රලේඛයෙහි 5.1 ජේදය | අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන නිලධාරියෙකු අමාත්‍යාංශයේ වාහනයක් ධාවනය කර තිබුණි. |

3.6 කාර්යසාධනය

-----------------

අමාත්‍යාංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් කිහිපයක් අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

(අ) මහඉලුප්පල්ලම ගොවිපලේ බීජ ගබඩාවක් ඉදිකිරීම හා බීජ නිෂ්පාදනය යාන්ත්‍රීකරණය කිරීම සඳහා 2014 ජුලි මාසයේදී රු.මිලියන 34.3 ක මූල්‍ය ප්‍රතිපාදන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණි. ඉන් රු.මිලියන 11.1 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වී නොතිබුණු කෘෂි ළිදක් ඉදිකිරීම හා මීටර් 700 ක මාර්ගයක් බොරළු ඇතිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. ගිවිසුමට අනුව මාර්ගයෙහි බොරළු ඇතිරීම මාස දෙකකින් අවසන් කළ යුතු වුවද, කොන්ත්‍රාත්තුව පිරිනමා වර්ෂ දෙකක් ඉකුත් වී තිබුණද, ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

(ආ) අතිරේක ආහාර බෝග නිෂ්පාදන වැඩ සටහන යටතේ මිලදී ගෙන තිබුණු බීජ වප්කර 12 ක් 2015 ජුනි 15 දින වන විට අනුරාධපුර අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට නිකුත් කර තිබුණි. 2015 ඔක්තෝබර් 21 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී බීජ වප්කර 9 ක් කෘෂිකර්ම උපදේශක කාර්යාලවලට නිකුත් කර තිබුණද, ඒවායේ පවතින අඩුපාඩු නිසා වප්කර 04 ක් ආපසු එවා තිබුණි. බීජ වැටීම ඒකාකාරී නොවීම, බීජ පළුදුවීම, බහුලව ගොවීන් භාවිතා කරන ට්‍රැක්ටර්වලට ඈඳාවිය නොහැකිවීම ආදී ගැටළු පවතින බව නිරීක්ෂණය විය. අමාත්‍යාංශය විසින් එවැනි වප්කර 44 ක් මිලදී ගැනීම සඳහා රු.2,562,560 ක් වැය කර තිබුණි.

(ඇ) කාබනික පොහොර ප්‍රචලිත කිරීම තුළින් රසායනික පොහොර භාවිතය අඩුකර වගාවන් සිදුකිරීමේ අරමුණ සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩ සටහනක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 300 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 251.6 ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට වෙන්කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගොවිජන සේවා මධ්‍යස්ථාන 558 ක කෘෂි උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 229 ක් වෙන් කර තිබුණි. එයින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 18 ක අවශ්‍ය ඉඩ පහසුකම් නොමැතිවීම හා ජල හිඟ වීම නිසා මෙම වැඩ සටහන ක්‍රියාත්මක කර නොතිබුණි. අනෙකුත් ගොවිජන මධ්‍යස්ථානවල මෙම කාර්යය ක්‍රියාත්මක කළද ප්‍රගතිය සියයට 29 ක් දක්වා අඩු මට්ටමක පැවතුණි.

(ii) අතහැරදමා ඇති කුඹුරු අක්කර 850 ක් කාබනික පොහොර යොදා වගා කිරීම සඳහා රු. මිලියන 10 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක 06 ක ඉඩම් අක්කර 684.7 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන බව දක්වා තිබුණද ඉලක්ක සපුරා නොතිබුණි.

(ඈ) අවාරය යැයි සැලකෙන මැයි, ජුනි හා ජුලි මාසවලදී අස්වනු ලැබීමේ අපේක්ෂාවෙන් එළවළු වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිය කඩිනම් වැඩසටහනක් ලෙස ඉටු කිරීම නිසා නිශ්චිත නිර්නායකයන් සකස් කර ගොවි පවුල් තෝරාගෙන නොතිබුණි. දිස්ත්‍රික්ක 25 ක කෘ.ප.නි.ස කලාප 11,333 කට පැල කට්ටල 566,650 ක් බෙදාදීමට තීරණය කර තිබුණද, එම පැල කට්ටල මිලදී ගැනීමට ගොවි පවුල්වල අකමැත්ත පල කිරීම නිසා හා අතිරික්ත පැල වෙළඳපොලේ අඩු මිලට අලෙවි කිරීම නිසා පැල කට්ටල 360,014 ක් පමණක් බෙදාහැර තිබුණි. පැල වගා කිරීමෙන් පසු ලබාගත් අස්වනු ප්‍රමාණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවූ අතර පැල තවාන්කරුවන්ට 2015 නොවැම්බර් මාසය වන විට රු.18,489,073 ක් ගෙවිය යුතුව තිබුණි.

(ඉ) වාණිජ ගොවිපල සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ 2014 හා 2015 වර්ෂවලදී අදාළ නිර්ණායකයන්ගෙන් බැහැරව රු.50,000 කට වඩා ඉහළ ආදායම ලබන ගොවීන් හා දැනටමත් වාණිජ මට්ටමේ කටයුතු කරන ගොවීන් තෝරාගෙන තිබුණි. පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම නිසා ගොවීන්ට නියමිත වේලාවට පැල නොසැපයීම, ආරක්ෂිත ගෘහ නියමිත වේලාවට ඉදි නොකිරීම වැනි දුර්වලතා නිරීක්ෂණය විය. නියැදි විගණන පරීක්ෂාවේදී කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් ගොවීන් තිදෙනෙකුට රු.1,105,000 ක් වූ ප්‍රතිලාභ වර්ෂය අවසාන වන විටත් ලබා දී නොතිබුණි.

(ඊ) මාතලේ දිස්ත්‍රික්කයට අයත් ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිකළ කෘෂි ළිං හා විසුරුම් ජල පද්ධති සඳහා ගෙවීම් කිරීමට 2015 ජුලි මාසයේදී රු.මිලියන 1.360 ක් මාතලේ දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණි. ළිං බැඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා තිබුණද, කෘෂි ළිං 3 ක වැඩ නිමකර නොතිබුණි. මෙම ආධාර මිරිස් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා ලබා දී තිබුණද, භෞතිකව පරීක්ෂා කළ නියැදියට අයත් කිසිදු ගොවියෙකු මිරිස් වගා කර නොතිබුණි. වී, එළවළු හා පළතුරු වගාවන් සඳහා ජලය සපයාගෙන තිබුණි.

(උ) මන්නාරම් දිස්ත්‍රික්කයේ මුං මිලදී ගැනීම සඳහා රු.මිලියන් 6.00 ක ප්‍රතිපාදන 2015 සැප්තැම්බර් මාසයේදී මන්නාරම දිස්ත්‍රික්ක ලේකම් වෙත ලබාදී තිබුණි. අස්වැන්න මිලදී ගෙන ගබඩා කිරීම හා අලෙවි කිරීම පිළිබඳ සුදුසු ක්‍රමවේද අනුමත කරගෙන නොතිබුණු අතර රු.මිලියන් 6.00 කින් රු.මිලියන් 1.25 ක් වැයකර තිබුණද, මුං මිලදී ගැනීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) 118-2-3-20-2502 වැය විෂය යටතේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමේ වැඩසටහන සඳහා රු.මිලියන 500 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 305 ක් වැය කර තිබුණු අතර ඉන් වැය විෂයයට අදාළ නොවන රු.14,878,500 ක් හෙවත් සියයට 4.88 ක් වියදම් කර තිබුණි.

## 3.7 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

-----------------------------------

තරුණ කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන සඳහා දඹුල්ල ප්‍රාදේශීය කොට්ඨාශයේ ප්‍රතිලාභියකුට රෝද හතරේ ට්‍රැක්ටරයක් මිලදී ගැනීම සඳහා සියයට 50 ක දායකත්වය යටතේ රු.500,000 ක් ලබාදී තිබුණි. මෙම ට්‍රැක්ටරය ප්‍රතිලාභියා නමින් ලියාපදිංචි කර තිබූ අතර භෞතිකව පරීක්ෂා කළ දිනයේ ලියාපදිංචි සහතිකය පරීක්ෂා කිරීමේදී ට්‍රැක්ටරය කල්බදු සමාගමකට පවරා මුදල් ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.8 අවිධිමත් ගනුදෙනු

----------------------

2015 සැප්තැම්බර් 21 දිනැති පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම හා අතිරේක කාර්යාල ඉඩකඩ අවශ්‍යතාවය සඳහා ගොවිජන මන්දිර ගොඩනැගිල්ල පවරා ගැනීමටත් කෘෂිකර්ම අමාත්‍යාංශය සෙත්සිරිපාය නව ගොඩනැල්ලේ ස්ථාපිත කිරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. සෙත්සිරිපාය ගොඩනැල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමින් තරගකාරී මිල ගණන් ලබාගැනීමෙන් හෝ කමිටුවකින් මිල තීරණය කිරීමකින් තොරව වර්ෂ 5 ක් සඳහා රු.මිලියන 958 ක් කුලී ගෙවීමට එකගව විචක්ෂණභාවයකින් තොරව ගිවිසුමකට එළඹ තිබුණි.

## 3.9 අනාර්ථික වියදම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවකයින්ට ස්ථිර පත්වීම් ලබාදීමේ හා අමාත්‍යාවරුන්ගේ වැඩ භාරගැනීමේ උත්සව දෙකක් සඳහා රු.347,700 ක අනාර්ථික වියදමක් කර තිබුණි.

(ආ) ඉරණමඩුවේ පවත්වා තිබූ ගොවීන් හා නිලධාරීන් 2000 ක් පමණ සහභාගී වූ සමාරම්භක උත්සවයකට කැනපි හට් හා පුටු ලබා ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ සභාපති විසින් නම් කරන ලද ආයතන තුනකින් මිල ගණන් ලබාගෙන තිබුණි. එම මිල ගණන් අනුව අවම මිල ඉදිරිපත් කළ වාද්දුව ප්‍රදේශයේ ආයතනයකට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. නැගෙනහිර පළාතට ආසන්න ආයතනයකින් අදාළ සේවාව ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු නොකර ප්‍රවාහන වියදම් සඳහා රු.360,000 ක් ඇතුළුව රු.2,433,455 ක් වැය කර තිබුණි. ගෙවීම් කිරීමට පෙර තාක්ෂණික නිලධාරියෙකුගේ සහයක් ලබාගෙන නොතිබුණි.

**3.10 කළමනාකරණ අකාර්යක්ෂමතා**
---------------------------------------

අමාත්‍යාංශය ගොඩනැගිල්ලේ ගිනි නිවීමේ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුව රු.5,942,150 කට ලංසුව ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කර තිබුණි. උපදේශක සමාගමේ ඇස්තමේන්තු අගය රු.7,689,500 ක් වූ බැවින් ප්‍රදානය කළ අගය තක්සේරු අගයට වඩා රු.1,747,250 කින් අඩු අගයක් වී තිබුණි. මෙම කොන්ත්‍රාත්කරු සමගද ගිවිසුමට එළඹීමෙන් පසු වැඩ ආරම්භ කිරීමට රු.1,188,430 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු වැඩ නිම නොකර කොන්ත්‍රාත්තුව අතහැර තිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**
---------------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව
------------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 138 | 105 | 33 | - |
| (ii) | තෘතියික මට්ටම | 11 | 06 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,359 | 1,079 | 280 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 195 | 127 | 68 | - |
| (v) | අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම | - | 09 | - | 09 |
| | **එකතුව** | **1,703** | **1,326** | **386** | **09** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික පොහොර ලේකම් කාර්යාලයට අනුයුක්ත කර සිටි සහකාර අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් 2003 ජනවාරි 01 දිනෙන් පසු කළමණාකරන සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කළ වැටුප් පරිමාණය අනුව පරිවර්තනය කර තිබුණි. ඉන් අනතුරුව SL-I-2006 වැටුප් පරිමාණයේ වැටුප් පියවර ලබාදිය යුතු බව දක්වා තිබුණත්, පෙර සිදු කළ වැටුප්

පරිවර්තනයේ නිවැරදිතාවය තහවුරුකර ගැනීමකින් තොරව SL-I-2006 නව වැටුප් පියවරයන්හි පිහිටුවා තිබුණි.

(ආ) 2015 ජනවාරි 01 දින සිට සහකාර අධ්‍යක්ෂවරුන් SL-I-2006 වැටුප් පියවරේ පිහිටුවීම සිදුවිය යුතු බව අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. ඊට පටහැනිව නිලධාරින් දෙදෙනෙකුට හිඟ වැටුප් වශයෙන් රු.1,296,384 ක් ගෙවා තිබුණි.

(ඇ) මෙම නිලධාරීන් වැඩි දෙනෙකු තාවකාලික පදනම මත 1997 හා 1998 වර්ෂවලදී සේවයට පත්කර තිබුණද, 2000 අගෝස්තු 01 දින ස්ථිර පත්වීම් ලබා තිබුණි. එහෙත් පත්වීම ස්ථිර කිරීමේදී තාවකාලික පදනම මත පත්කළ දින දක්වා පෙර දාතම් කර තිබුණද, එසේ පෙර දාතම් කිරීමට ඇති හැකියාව විගණනයේදී තහවුරු නොවුණි.